දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 04/2018 (1)
අත්තිකාරම් ගිණුම් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2018.10. 

සියළුම බන්ධනාගාර කොමසාරිස්වරු
සියළුම අධ්‍යක්ෂකවරු
සියළුම මාණ්ඩලික නිලධාරීන්
සියළුම බන්ධනාගාර අධිකාරිවරු සහ සහකාර බන්ධනාගාර අධිකාරිවරු වෙත

**ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව ආපදා ණය ගෙවීම, අයකිරීම, ගිණුම් ගත කිරීම හා වාර්තාකරණය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමට අදාලව ආපදා ණය ගෙවීම, අයකිරීම, ගිණුම් ගත කිරීම හා වාර්තාකරණය සම්බන්ධයෙන් 2018.02.14 දින නිකුත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2018 හි 4.6 වගන්තිය පහත අනුව සංශෝධනය කරනු ලැබේ.

4.6. වාරික අය කිරීම -

නිලධාරියෙකුට දෙන සියළුම ණය එක් ණය මුදලක් ලෙස ඒකාබද්ධ කල යුතු අතර , යම් නිලධාරියකුගෙන් අය කළ යුතු වාරිකය හා වාරික ප්‍රමාණය තීරණය කිරීම XXIV පරිච්ඡේදයේ 3.6 වගන්තිය අනුව පහත සඳහන් පරිදි සිදු කළ යුතුය. ලබා දෙන මුළු ආපදා ණය මුදල උපරිම වාරික 100 කින් අය කළ යුතුය.

| ණය ප්‍රමාණය | මාසික වැටුපේ ප්‍රතිශතය |
|---|---|
| මාස 10ක වැටුප හෝ ඊට අඩු | 10 |
| මාස 10ක වැටුපට වැඩි හා මාස 12ක වැටුප දක්වා | 15 |
| එක් අවුරුද්දක වැටුපට වැඩි හා අවු.2ක වැටුප දක්වා | 20 |
| අවු.2ක වැටුපට වැඩි හා අවු.3ක වැටුප දක්වා | 25 |
| අවු.3ක වැටුපට වැඩි හා අවු.4ක වැටුප දක්වා | 30 |
| අවු.4ක වැටුපට වැඩි හා අවු.5ක වැටුප දක්වා | 35 |
| අවු.5ක වැටුප හා ඊට වැඩි | 40 |

උදාහරණ

නිලධාරියකුගේ මාසික වැටුප රු. 35,000.00 ක් ලෙස උපකල්පනය කළහොත් වාරික මුදල හා වාරික සංඛ්‍යාව තීරණය කිරීම

වාරික මුදල = රු.35,000 x10 /100 = රු 3500.00
වාරික සංඛ්‍යාව = රු. 250,000 / 3500 = වාරික 71
වාර්ෂික පොළි අනුපාතය 4.2 % වන අතර හිග ණය ශේෂය සඳහා මාසිකව පොළි ප්‍රමාණය ගණනය කර වාරික මුදල සමග වැටුපෙන් අය කළ යුතුය.

වැටුපෙන් 40% ගණනය කිරීම

ගෙවිය යුතුණය ප්‍රමාණය තීරණය කිරීමේදී නිලධාරියාගේ මාසික වැටුපෙන් 40% සීමාව තුළ ණය වාරිකය අය වන බවට සැහීමකට පත් විය යුතුය.

40% සීමාව ගණනය කිරීම

**( මාසික මූලික වැටුප + ගැලපුම් දීමනාව ) x 40% = ණය වාරික වශයෙන් අය කර ගත හැකි උපරිම මුදල ( 03 / 2016 චක්‍රලේඛයේ 15.1 වගන්තියේ සඳහන් පරිදි )**

මෙම 40% සීමාව ගණනය කිරීමෙන් පසු ණය වාරික අය කිරීමට ඉතිරි වන මුදල ගණනය කිරීමේදී පහත සඳහන් අඩු කිරීම් සලකා බලනු නොලැබේ.

I. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට කරන අවකරණ
II. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට කරන අවකරණ
III. ආදායම් බදු අඩු කිරීම
IV. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ ජාතික රක්ෂණ භාර අරමුදලට කරනු ලබන වාරික අය කිරීම්
V. උත්සව අත්තිකාරම් අය කිරීම
VI. ගෙවන ලද වැටුප් අත්තිකාරම් ආපසු අය කිරීම්
VII. වැටුප් වැඩිපුර ගෙවීම , අඩ වැටුප් නිවාඩු හා පඩි රහිත නිවාඩු වලින් කරනු ලබන ආපසු අය කිරීම්
VIII. නිවාස ණය ( ආයතන සංග්‍රහයේ වැනි XXIV පරිච්ඡේදයේ 11 වැනි වගන්තිය යටතේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ලබා දෙන දේපල ණය පමණක් සළකා බලනු ලබන අතර පුද්ගලිකව ලබා ගන්නා නිවාස ණය මේ යටතට නොගැනේ.)
IX. ජාතික නිවාස කොමසාරිස් විසින් දැනුම් දෙනු ලබන මුදල් ප්‍රමාණය
X. ලොහාර් ආර්යා ණය මුදලට යටත් කොට බැඳ තබා ඇති රක්ෂණ ඔප්පු වෙනුවෙන් වූ වාරිකය
XI. රජය වෙනුවෙන් පිරිනමන ත්‍යාග

නිලධාරියාගේ මාසික වැටුපෙන් 40% ප්‍රමාණය තුළ සියලුම ණය අය කර ගැනීමට හැකි වන පරිදි ණය නිකුත් කිරීම නිලධාරින්ගේ වගකීම වේ. 40% වටිනාකමින් පහත සඳහන් අවකරණ අඩු කිරීමෙන් පසු ආපදා ණය මුදල අය කිරීමට ඉතිරි මුදල ගණනය කළ යුතුය.

I. වානිජ බැංකු වලින් ලබා ගෙන ඇති ණය වෙනුවෙන් අය කරන වාරික
II. වෙනත් පෞද්ගලික ආයතන වෙත හෝ පුද්ගලයන් වෙත වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති මුදල්
III. විශේෂ අත්තිකාරම්, ආපදා ණය, ආපදා ණය පොලී හා රජය මඟින් සඳහන් කල 40% සීමාවට ගැනෙන ණය වාරික
IV. විවිධ සංගම් වල වාරික

ඉහත අවකරණ අඩු කිරීමෙන් පසු ආපදා ණය වාරික වශයෙන් අය කර ගැනීමට ඉතිරි වන මුදල අනුව ලබා ගත හැකි ආපදා ණය මුදල තීරණය කල යුතුය.

උදාහරණ

2018.01.01 දිනට බන්ධනාගාර නියාමකවරයෙකුගේ මූලික වැටුප රු.25,396.00ක් හා ගැලපුම් දීමනාව රු.3,174.00ක් වන අතර ඔහුගේ 40% සීමාව රු. 11,428.00 කි. එම මුදලින් නිළධාරියා ලබා ගෙන ඇති පහත සඳහන් ණය මුදල් අඩු කළවිට තව දුරටත් 40% සීමාව තුල වාරික වශයෙන් අයකළ හැකි මුදල පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 40% සීමාව | = | | රු.11,428.00 |
| අවකරණ | = | | |
| ලංකා බැංකුව | = | රු. 3,000.00 | |
| මහජන බැංකුව | = | රු. 4,500.00 | රු. 7,500.00 |
| ඉතිරි මුදල | = | | රු. 3,928.00 |

ඒ අනුව වාරික වශයෙන් තව දුරටත් අඩු කළ හැකි මුදල රු. 3,928.00 කි. ඉහත උදාහරණය අනුව මාසික ණය වාරිකය රු.2,539.60 ක් බැවින් 40% සීමාව තුළ වාරික අවකරණ කර ගැනීමට යටත්ව ණය මුදල එම නිළධාරියාට සම්පූර්ණයෙන් ගෙවිය හැක.

උදාහරණ 2

ඉහත නිළධාරියා විසින් පිළිවෙළින් ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් ලබා ගෙන ඇති ණය වාරික රු. 6,000.00 ක් හා රු. 3,000.00 ක් යැයි සිතමු. එවිට 40% සීමාව තුළ එම අවකරණ සිදු කිරීමෙන් පසු ඉතිරි වන මුදල රු. 2,428.00 කි. ( රු. 11,428.00 - රු. 9,000.00 = රු. 2,428.00 ) 40% සීමාව තුළ තව දුරටත් අය කළ හැකි මුදල රු. 2,428.00 කි. එබැවින් මාසික වාරිකය රු. 2,539.60ක් අය කර ගැනීමට නොහැකි වන නිසා එම නිළධාරියා හට ආපදා ණය ගෙවීම සිදු කළ නොහැක.

එබැවින් මීට පෙර නිකුත් කර ඇති දෙපාර්තමේන්තු චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසි වලට අනුකූලව ඉහත සංශෝධන අනුව ආපදා ණය ගෙවීමේදී කටයුතු කිරීමට දෙපාර්තමේන්තුවේ ආපදා ණය ගෙවීම් කරනු ලබන සියළුම ආයතන කටයුතු කලයුතු බව කාරුණිකව දැනුම් දෙමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත් -

1. බන්ධනාගාර කොමසාරිස් ( අභ්‍යන්තර විගණන) - දැ.ග.ස.